# ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

## தேசிய மொழிக்கல்வி மற்றும் பயிற்சி நிறுவனம்

## National Institute of Language Education and Training

## ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ පුරප්පාඩු වී ඇති ගණකාධිකාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

මෙම ආයතනය 2007 අංක 26 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත අර්ධ රාජ්‍ය ආයතනයක් වන අතර, එහි මාකුඹුර, පන්නිපිටියේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ පුරප්පාඩු වී ඇති ගණකාධිකාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**ගණකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම**

**කාර්යයන්**

- ආයතනයට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම හා මූල්‍ය කළමනාකරණය
- ආයතනයේ මුදල් කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල් මගින් ආයතනයට වගකීම
- මූල්‍ය පරිපාලනයට නීති රීති හා රෙගුලාසි සකස් කිරීම
- අයවැය සහ අවසාන ගිණුම් අධීක්ෂණය හා සම්බන්ධීකරණය
- ආයතනයේ ටෙන්ඩර් මණ්ඩලය නියෝජනය හා ගබඩා කටයුතු අධීක්ෂණය
- ගිණුම් අංශයේ නිලධාරීන් විසින් ගිණුම් කටයුතු නිවැරදිව සිදු කරන බවට වග බලා ගැනීම
- පත්වීම් බලධාරියා විසින් පවරනු ලබන තනතුරට අදාළ වෙනත් රාජකාරි

**පත්වීමේ ස්වභාවය**

ස්ථිර තනතුරකි. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායකත්වය හිමි වේ.

**වැටුප් පරිමාණය** -MM 1-1 2006 Grade II - රු.53,175 - 10X1,375 - 15X1,910 - 95,575/=

- ගණකාධිකාරී තනතුර සඳහා අභ්‍යන්තර හෝ බාහිර අයදුම්කරුවන් ලෙස අයදුම් කරන්නේ නම්

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය කළමනාකරණ හෝ ගිණුම්කරණය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම හෝ

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ /එක්සත් රාජධානියේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම සහ

ඉහත (අ) හෝ (ආ) සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු එම සුදුසුකම බඳවා ගැනීමේ අවම සුදුසුකම් ලෙස සලකන ලද තනතුරක මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද ලබා තිබීම.

**වයස -**

අවුරුදු 22ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලපාන්නේ නැත)

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

ආයතනයේ කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ (JM) ගිණුම් නිලධාරී තනතුරෙහි වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ඉහත තනතුර සඳහා වන පොදු කොන්දේසි :**

(අ) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුයි.

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ) සේවකයා සිය වැටුපෙන් 8%ක් සේවක අර්ථසාධක අරමුදලට දායක වන අතර, සේව්‍යයා විසින් 12% ක්ද, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3%ක්ද, ප්‍රදානය කරනු ඇත.

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු පිළිවෙල :-**

ජීවදත්ත විස්තර හා ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක, විද්‍යුත් තැපැල් ලිපින සහ තැපැල් ලිපින ඇතුළත් තමන් විසින් සකස් කළ අයදුම් පත්‍රය, අධ්‍යාපන, වෘත්තීය සහතික පිටපත් සමග **2024 ජනවාරි මස 17** වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය/ රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති.**
**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය,**
**නො. 321/1A,**
**හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය.**